# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,480—1965 අගෝස්තු 13 වැනි සිකුරාද—1965.8.13**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට, වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 589 | ආදයම හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... ... | 592 | අය-වැය ලේඛන ... ... ... | 597 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපළ විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 596 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යට ත් දැන්වීම ... | 597 | විවිධ දැන්වීම ... ... ... | 598 |


## පළාත් පාලන නිවේදන

### දෙහිඕවිට සුළු නගර සභාව

**සුළු නගර සභා ආඥාපනත**

### 1965 වර්ෂය සඳහා වූ දේපළ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 159 (1) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඔහු විසින් දෙනු ලැබූ අනුමැතිය ඇතිව, සභාව විසින් නියම කළ හැකි සීමා කිරීම්, විශේෂයන් සහ කොන්දේසි වලට යටත්ව, දෙහිඕවිට සුළු නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල (කුඹුරු හැර) වාර්ෂික වටිනාකමෙන් සියයට හතර බැගින් වූ වරිපනම් බද්දක්, කොටස් දෙකකින් ගෙවා අවසාන කළ හැකි අන්දමට 1965 වර්ෂය වෙනුවෙන් දෙහිඕවිට සුළු නගර සභාව විසින් පනවනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,<br>
පළාත් පාලන අමාත්‍යාංශයේ<br>
සථිර ලේකම්.

1965 ජූලි මස 29 වැනි දින,<br>
කොළඹ දීය.

488–65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

ඇල්.ඞී.—බී 69/41.<br>
ප.පා.දෙ.—ජීඊ 1/1/36.

**ගම්සභා ආඥාපනත**

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුවෙල්වම් වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළේ යටිගහ පත්තුවේ පල්ලෙවෙල ගම් ප්‍රදේශයේ ගම්සභාවට, ඒ ප්‍රදේශයෙහි ඉඩම් බද්දක්, ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමට මේ නිවේදනයෙන් බලය පවරමි.

ඇම්. තිරුවෙල්වම්,<br>
පළාත් පාලන ඇමති.

1965 ජූලි මස 8 වැනි දින,<br>
කොළඹ දීය.

8–482-–65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී. 9/58.

**තානායම් පනත**

(275 වැනි අධිකාරය වන) තානායම් පනතේ 4 වැනි වගන්තිය යටතේ, ගම්පහ තානායම සඳහා, ඒ වෙනුවෙන් නියමිත බලධරයා වන ගම්පහ නගර සභාව විසින් සම්පාදිතව, යථෝක්ත වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථාවයි.

ඇ. එ. ගෝගලි මොරගොඩ,<br>
පළාත් පාලන අමාත්‍යාංශයේ<br>
සථිර ලේකම්.

1965.7.26 කොළඹ දීය.

**ව්‍යවස්ථාව**

(275 වැනි අධිකාරය වන) තානායම් පනතේ 4 වැනි වගන්තිය යටතේ ගම්පහ නගර සභාව විසින් සම්පාදිතව, 1958 අප්‍රේල් 25 වැනි දින අංක 11,302 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද ව්‍යවස්ථා, ඊට යාකොට ඇති 1 වන උපලේඛනයෙහි 2 (1) (අ) සහ 2 (1) (ආ) වන ඡේද වෙනුවට පහත සඳහන් ඡේදය, එනම් :—

"2. ඇඳ ඇතිරිලි සහිත නිදන කාමරයන් පාවිච්චි කිරීම පිණිස,

(i) පැය 24ක කාලයකට හෝ ඊට අඩු කාලයකට කාමරයක් පාවිච්චි කිරීම සඳහා, එක් අයෙකුට රු. 5.00."

ආදේශ කිරීමෙන් සහ I වන උපලේඛනයේ 2 (II) වන ඡේදය සහ II වන උපලේඛනය අත්හැරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8–489—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

ඇල්.ඕ.—ඕ 17/65.

## වරකාපොල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා වූ දේපළ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 159 (1) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, සභාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, විශේෂයෙන් සහ කොන්දේසිවලට යටත්ව, වරකාපොල නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ වරිපනම් බද්දක් පිළිවෙලින් 1965 ජූලි 31, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් තුනකින් ගෙවිය හැකි වන පරිදි 1965 වර්ෂය සඳහා වරකාපොල සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ජූලි 29 වන දින,
කොළඹ දීය.

8–468—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1965 සඳහා කසළ ශෝධන විශෙෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 129 (ආ) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් සහ නිදහස් කිරීම් වලට යටත්ව රුවන්වැල්ල නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වූ කසළ ශෝධන විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙලින් ජූලි 31 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි කොටස් දෙකකින් ගෙවා අවසාන කළ හැකි අන්දමට 1965 වර්ෂය සඳහා රුවන්වැල්ල සුළු නගර සභාව විසින් පනවන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ජූලි මස 29 වැනි දින,
කොළඹ දීය.

8–466—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා වූ දේපළ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 159 (1) වැනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිම් ඇතිව, සභාව විසින් නියම කරනු ලැබියහැකි සීමා කිරීම්, විශේෂයෙන් සහ කොන්දේසි වලට යටත්ව රුවන්වැල්ල නගරය තුළ පිහිටා තිබෙන කුඹුරු හැර සියලුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ වරිපනම් බද්දක්, පිළිවෙලින් ජූලි 31 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් දෙකකින් ගෙවා අවසාන කළහැකි අන්දමට 1965 වර්ෂය සඳහා රුවන්වැල්ල සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1965 ජූලි මස 29 වැනි දින,
කොළඹ දීය.

8–469—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## මීරිගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා කසළ ශෝධන වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 129 (ආ) වෙනි වගන්තිය යටතේ සහ එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව, සභාව විසින් නියම කළහැකි සීමා කිරීම්, විශේෂයෙන් හා කොන්දේසි වලට යටත්ව, මීරිගම නගරය තුළ පිහිටා තිබෙන මෙහි උපලේඛණයෙහි සඳහන් කොට ඇත්තාවූ සියළුම නිශ්චල දේපළ වල වාර්ෂික වටිනාකමින් සියයට පහක් බැගින් වූ වරිපනම් බද්දක්, පිළිවෙලින් සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් දෙකකින් ගෙවා අවසාන කළහැකි අන්දමට 1965 වර්ෂය සඳහා මීරිගම සුළු නගර සභාව විසින් පනවනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලි මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්,

1965.7.26 වැනි දින,
කොළඹ දීය.

#### උපලේඛනය

පහත දක්වෙන වරිපනම් අංක දරන ස්ථාන පිහිටි ප්‍රදේශය :—

**අංක 1 දරන ඡන්ද කොට්ඨාශය**

අංක 1.
අඹේපුස්ස පාර :–අංක 35/6.

ගිරිඋල්ල පාර :–අංක 57, 69, 75, 79, 83, 93, 103, 105, 107, 113, 117, 123, 78, 120/1, 120/3, 122, 170.

**අංක 2 දරන ඡන්ද කොට්ඨාශය**

දන්ඕවිට පාර :–අංක 24, 118.

**අංක 3 දරන ඡන්ද කොට්ඨාශය**

පස්යාල පාර :–අංක 91, 97, 109/1, 119/1, 119/7, 119/8, 119/9, 119/10, 119/11, 119/12, 119/13, 119/16, 119/17, 119/18, 121, 123, 125, 127, 129, 131, 135, 137, 141, 143, 145, 147, 215, 217, 219, 221, 223, 225, 227, 229, 231, 233, 235.

සුමනසාර මාවත :–අංක 19.

**අංක 4 දරන ඡන්ද කොට්ඨාශය**

පස්යාල පාර :–අංක 241, 265, 271, 283, 285/1.

**අංක 5 දරන ඡන්ද කොට්ඨාශය**

ගිරිඋල්ල පාර :–අංක 19, 23, 39, 43.
පස්යාල පාර :–අංක 2.

8–479—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පණතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, උතුරු මධ්‍යම පෙදෙසේ පළාත් පාලන සහකාර කොමසාරිස් වන චාර්ල්ස් විලියම් ද සිල්වා වන මම, අනුරාධපුර දිස්ත්‍රික්කුවේ මාමිණියා කෝරලේ ගම්සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ ගම් සභික ඇස්. ඩබ්ලිව්. ඇම්. ගුණතිලක බණ්ඩාර මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙළින් මාමිණියා කෝරලේ ගම්සභාවේ සභාවාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, අනුරාධපුර දිස්ත්‍රික්කුවේ මාමිණියා කෝරලේ ගම්සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ සභික, ඇස්. ඩබ්ලිව්. ඇම්. ගුණතිලක බණ්ඩාර මහත්මයා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලකිරීමේ දිනයේ සිට සභිකත්වය අත්හරිනලද බව, මම මෙයින් ප්‍රකාශ කරමි.

චාර්ල්ස් විලියම් ද සිල්වා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
උතුරු මැද පෙදෙස.

පළාත් පාලන කාර්‍යාලය,
අනුරාධපුරය. 65.7.28.

8–472—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

## එල්ලාවල ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරිය)**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරියේ) 17 1 දරණ උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නියමිත බලධාරීනැනවූ ද, රත්නපුර දිස්ත්‍රික්කයේ එල්ලාවල ගම්සභාවේ සභාපති තැනවූද, එච්. ඩී. චන්ද්‍රසිරි වන මම ඉහත සඳහන් ගම්සභා සීමාවතුල මස් පිණිස සතුන් මැරීම 1965 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා සම්පූර්ණයෙන් තහනම් කරමි.

එච්. ඩී. චන්ද්‍රසිරි,
එල්ලාවල ගම්සභාවේ සභාපති.

එල්ලාවල ගම්සභා කාර්‍යාලය,
තලාවිටිය, පරකඩුව,
1965 ජූලි මස 30 වෙනි දින දීය.

8–460—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953.4.10 දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953.8.7 දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 1, 3, 5, 7, 19, 20, 22, 24, 25, 26, 28, 29, 30, 31, 32, 33, 34, 36 හා 37 යන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට වලව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

ඇම්. ජී. සෙඩෝරිස්,
සභාපති තැන.

1965.3.8 දින,
වලව ගම්සභා කාර්‍යාලයේදීය.

8–473—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

ප.පා.දෙ.—ජී. 19/1/17/2

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ බෙම්මුල්ල ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1953නේ අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථා I සිට XXXVII දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට සම්මත කර ගැනීමට බෙම්මුල්ල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඩී. සී. දිසානායක,
බෙම්මුල්ල ගම්සභාවේ සභාපති තැන.

1964ක්වූ දෙසැම්බර් මස 19 වැනි දින,
වටද්දර ගම්සභා කාර්යාලයේදීය.

8–483—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පනත

1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පනතේ 3 වන වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැඳකෝරලේ (නැගෙනහිර) ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

(අ) පළාත් පාලන ඇමතිතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ ඒ බැව් 1953 අගෝස්තු මස 7 වන දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබුවාවූද පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 1 සිට 37 දක්වා වූ කාණ්ඩද,

(ආ) උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ 1965 ජනවාරි මස 8 වන දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූ එකී අතුරු ව්‍යවස්ථා මාලාවේම අංක 38 දරණ කාණ්ඩයද,

මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කරගැනීමට කැඳකෝරලේ (නැගෙනහිර) ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු අදශී අතුරු ව්‍යවස්ථා) පිළිබඳ පණතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

සී. ඇම්. අප්පුහාමි,
කැඳකෝරලේ (නැගෙනහිර) ගම්සභාවේ සභාපති.

1965 ක්වූ ජූලි මස 31 වන දින,
කැඳැව ගම්සභා කාර්‍යාලයේදීය.

8–464—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පණතේ 3 වැනි වගන්තිය යටතේ ගාලු දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

**යෝජනාව**

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963නේ ජූනි මස 21 වැනි දින, අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965නේ ජනවාරි මස 8 වැනි දින, අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල XXXVIII කාණ්ඩය, මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට කරන්දෙනිය ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

විල්සන් විජේතුංග,
කරන්දෙනිය ගම් සභාවේ සභාපතිතැන.

1965 ක්වූ ජූනි මස 14 වැනි දින,
කරන්දෙනිය ගම්සභා කාර්යාලයේ දීය.

8–467—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## රක්වාන සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1965 වර්ෂය සඳහා විශේෂ වතුර බද්ද

(256 වෙනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 129 (බී) ඡේදය යටතේ අතුරු ව්‍යවස්ථාවෙන් නියම කළ හැකි සීමා හා නිදහස් කිරීම්වලට යටත්ව රක්වාන නගරය තුළ පිහිටා තිබෙන, මෙහි පහත උප ලේඛනයෙහි දක්වා ඇති පරිදි ජල සම්පාදන පහසුව සපයා ඇති, සියලුම නිශ්චල දේපොල වල වාර්ෂික වටිනාකමින් සියයට තුනක් බැගින් වූ විශේෂ වතුර බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වෙනි දිනයන්හි හෝ ඊට පෙර සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කළහැකි අන්දමට 1965 වර්ෂය සඳහා රක්වාන සුළු නගර සභාව විසින් පසුගිය වර්ෂය තුළ දී බලපැවැත් වූ ආකාරයටම පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ටී. ජී. කරුණාරත්න,
සභාපති,
රක්වාන සුළු නගර සභාව.

1965 ක්වූ ජූලි මස 9 වෙනි දින,
රක්වාන සුළු නගර සභා කාර්‍යාලයේ දීය.

#### උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරණ දේපලවලට අයත් ප්‍රදේශය හැරෙන්නට රක්වාන සුළු නගර සභාවේ පාලන සීමාව තුළ පිහිටි ප්‍රදේශය.

#### අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය

දෙනියාය පාර : අංක 2, 38, 48, 54/1, 62, 66, 82, 86, 98/2 සහ 108.
ඩිප්ඩීන් පාර : අංක 35.

#### අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය

මහ වීදිය : අංක 17, 19, 39, 47, 63, 67 සහ 75/1.

රත්නපුර පාර : අංක 10/1.

උක්වත්ත පාර : අංක 15, 15/1, 15/2, 17, 21, 25, 27, 29, 33 සහ 35.

#### අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය

කොලින්ස් පාර : අංක 7, 17, 23, 23/1, 22, 22/1 සහ 24.

දෙනියාය පාර : අංක 9, 37, 45, 49, 53, 83/1, 103, 107/2, 111 සහ 113/3.

මහ වීදිය : අංක 12, 42, 50, 72, 98/1, 142, සහ 150.

#### අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය

මහ වීදිය : අංක 247, 196, 206, 282, 286, 286/1, සහ 308.

#### අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය

රෝහල පාර : අංක 2 සහ 4.

මහ වීදිය : අංක 171, 193 සහ 209.

පනාගොඩ පාර : අංක 3, 11, 4/9, 26 සහ 54/2.

උක්වත්ත පාර : අංක 10/2, 10/5, 26, 32, 34, 34/1, 34/2, 46, 50, 54, 58, 60 සහ 66.

8–230/3—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර, මෙයින් පළකර සිටිනු ලැබේ.

#### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963.6.21 දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965.1.8 දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 38 යන කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට වලව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වෙනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ජී. සෙදෝරිස්,
සභාපති තැන.

1965.3.8 දින,
වලව ගම්සභා කාර්‍යාලයේදීය.

8–474—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ හක්මන-වලකඩ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙහි පළකරනු ලැබේ.

#### යෝජනාව

ප්‍රදේශ පාලන අමාත්‍යවරයා සම්පාදනය කරන ලද්දාවූද, සෙනේට් මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1956හේ ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශකරන ලද්දාවූද පොදු ආදශී අතුරු ව්‍යවස්ථාවල 38 කොන්ඩා සහ රැවුල් කපන ස්ථාන සහ කරණැවැම් මැදිරි පිළිබඳවූ ව්‍යවස්ථා කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට හක්මන-වලකඩ ගම් සභාව විසින් 1952කේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදශී අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ඩී. සී. අබේවික්‍රම,
හක්මන-වලකඩ ගම් සභාවේ ප්‍රධාන තැන.

වෂී 1965ක්වූ ජූලි 28 වැනි දින දීය.

8–478—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**1. දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාල වෙනම වෘත්තීය ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

————තනතුර සඳහා වූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස: අවුරුදු——, මාස————, දින————.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

**සාමාන්‍ය අධ්‍යාපනය**

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

**වෘත්තිය/ශිල්පීය අධ්‍යාපනය**

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාල සීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :———. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

**මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.**

———,
**අයදුම්කරුගේ අත්සන.**

දිනය :———.

**සභාපති,**
**පළාත් පාලන සේවා කොමිෂන් සභාව,**
**තැ. පෙ. 530,**
**කොළඹ 1.**

---

## පළාත් පාලන සේවය

### ගණකාධිකාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. **වැටුප.**—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,080—360 × 11—රු. 8,040.

3. **අවශ්‍ය සුදුසුකම්.**—

(අ) ලංකා ගණකාධිකාරි මණ්ඩලයේ අවසාන හෝ මධ්‍යම විභාගය හෝ නාගරික භාණ්ඩාගාරික සහ ගණකාධිකාරි (එංගලන්ත) (සංස්ථාගත) විභාගය සමත් නිලධාරීන්, හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ ගණක විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව ලත් අය හෝ සහතිකලත් සහ සංස්ථාගත ගණකාධිකාරී සංගමයේ සාමාජිකයෝ (පස් අවුරුද්දක් ගිණුම් පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්දක් මේ නිලධාරියාට තිබිය යුතුය.) හෝ,

(ඉ) රාජ්‍ය සේවයේ වැඩ බලන ගණකාධිකාරිවරුන් හෝ තාවකාලික ගණකාධිකාරිවරුන් හෝ,

(ඊ) රජය පිළිගත් සංස්ථාවල සේවයේ නියුක්ත ගණකාධිකාරිවරුන්.

4. අයදුම්කරුවන් 1965.8.31 දිනට අවුරුදු 40 නොඉක්මවා තිබිය යුතුය. අනික් කරුණු උඩ සුදුසුකම් ලබා තිබේ නම්, පළාත් පාලන සේවයේ නිලධාරීන්ගේ අයදුම් පත් වයස සීමාව නොසළකා සලකනු ඇත.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත් පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1965.8.31 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පයුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. අයදුම් පතක් තැපෑලේ දී නැතිවූ බවට, ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තමූම එවැනි අවදානම කට මුහුණ දෙති.

10. සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බව සතියක් තුළදී දන්වා එවනු ලැබේ.

**පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.**

තැ. පෙ. 530, කොළඹ,
1965 අගෝස්තු 7 දින.

**8–461—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.**

---

## පළාත් පාලන සේවය

### ජල කර්මාන්ත පරීක්ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරා ගනු ලබන අයදුම්කරු පළමුවරට කොළඹ නගර සභාවේ ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවට පත්කරනු ලැබේ.

2. **වැටුප.**—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,860—120×17 සහ 180×18—රු. 5,340. එහි රු. 3,420 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණයක් ද, රු. 4,800 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමක් ද ඇත්තේ ය.

3. ජල කර්මාන්ත පිළිබඳ සත් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්දක් (මෙයින් යටත් පිරිසෙයින් අවුරුදු 2ක් වත් ජල කර්මාන්ත කටයුතු ගැන විය යුතුයි) හා පහත සඳහන් කාර්මික සුදුසුකම්වලින් එකක් ඇති කොළඹ නගර සභාවේ ජල කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන්ගෙන් හා අනික් ප්‍රාදේශීය බලමණ්ඩලවල ජල කර්මාන්ත පරීක්ෂකයින්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි (සිවිල්) සහතිකය,

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ නාගරික ඉංජිනේරු ශිල්පය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල) පිළිබඳ අවසාන සහතිකය,

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි නිර්මාණය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල) පිළිබඳ අවසාන සහතිකය හෝ වෙනත් සමාන සුදුසුකමක්.

4. තෝරාගනු ලැබූ අයදුම්කරු කොළඹ නගරයේ සිට සැතපුම් 10ක අධි විෂ්කම්භයක් ඇතුළත පදිංචි විය යුතු අතර, ජල කර්මාන්ත ඉංජිනේරු තැන විසින් නියම කරනු ලබන පරිදි, ඒ අවස්ථාවල කලටුවාව හෝ ලබුගම මූලස්ථානවල වැඩ කරන ලෙස නියම කරනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදශී ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙලකොට 1965 අගෝස්තු මස 31 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාර දී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසුකම ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට දින 7ක් ඇතුළත ලැබුණු බව දන්වා එවනු ලැබේ.

**පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ**
**සභාපති.**

1965.8.2 දින,
තැ. පෙ. 530,
කොළඹ.

**8–481—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය**

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය

### විදුලි පෝර්මන් තනතුර

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ විදුලිය පෝර්මන් තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

**වැටුප් ක්‍රමය :**

රුපියල් 960—24×72—2,688 වාර්ෂිකව ; තෝරා ගන්නා ලද අයදුම්කරු සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ සුදුසු පියවරක තබනු ඇත.

**සුදුසුකම් :**

(අ) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත අයෙකු විය යුතුයි.

(ආ) වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද නියෝග තේරුම් ගැනීමේ හැකියාවක් ද, විශාල ජනක යන්ත්‍ර, ස්විච්බෝඩ් උපකරණ, විදුලි මෝටර්, ස්ටාර්ටර් හා සටහන් කිරීමේ උපකරණ නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ප්‍රවීණතාවයක් ද තිබිය යුතුයි.

(ඈ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටිය යුතුයි.

(ඉ) පිළිගත් විදුලි ඉංජිනේරු වැඩපලක හෝ ආයතනයක පස් අවුරුද්දකට නො අඩු පළපුරුද්දක් ලබා තිබෙන්නන් ගැන විශේෂයෙන් සලකා බලනු ඇත.

ලිපිනය ලියූ මුද්දරයක් සහිත දිග ලියුම් කවරයක් එවීමෙන් මෙම කාර්යාලයෙන් නියමිත අයදුම් පත් ලබාගත හැක.

සියලුම අයදුම් පත් "සාමාන්‍යාධිකාරි, අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය, අනුරාධපුර" යන ලිපිනයට 1965 අගෝස්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලිඛිත තැපැලෙන් එවිය යුතුය.

ජී. සී. දිසානායක,
සාමාන්‍යාධිකාරී,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය.

1965 අගෝස්තු මස 3 වැනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ දීය.

8–447—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—කොට්ටව ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය :—වර්ෂයකට රුපියල් 540—22×12—රු. 804 ; රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුදුසු කම් :

(අ) වයස : 1965 අගෝස්තු මස 25 වැනි දිනට වයස අවුරුදු 20ට නොඅඩු 30ට නොවැඩි වියයුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම්පත්‍ර, ඔවුන්ගේ අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙලකොට, 1965 අගෝස්තු මස 25 වැනි දිනට හෝ ඊට පළමු කොට්ටව ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්ට එවිය යුතුයි.

යූ. ජී. ජයසේන,
කොට්ටව ගම්සභාවේ
සභාපති තැන.

1965 අගෝස්තු 5 වැනි දින,
කොට්ටව ගම්සභා කාර්යාලයේ දීය.

8–491—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඞී.—බී. 14/52.

## රත්නපුර නගර සභාව

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ රත්නපුර නගර සභාව මගින් සම්පාදනය කරන ලදුව, එම ආඥා පනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවකි.

ඇ. ඒ. ගෝගලී මොරගොඩ,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1965 ජූලි මස 26 වැනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථාව

උකස් සම්බන්ධයෙන් 1931 සැප්තැම්බර් 18 වැනි දින අංක 7,882 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රත්නපුර නගර සභාවේ අතුරු ව්‍යවස්ථාවල 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් "සත පනහක්" යන යෙදුම වෙනුවට "රුපියල් දෙකක්" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒවා මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8–484—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

ඇල්. ඞී.—බී. 11/65.
ප. පා. දෙ—ජී. ජේ. 19/2/12.

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පින්නවල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඇ. ඒ. ගෝගලී මොරගොඩ,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1965 ජූලි මස 26 වෙනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

පහත දැක්වෙන ව්‍යාපාර අන්තරායදායක ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කබුක් ගල්, බොරළු හෝ කළුගල් සඳහා ගල් වළවල් හෑරීම.
හුණු ගල් ලබාගැනීම සඳහා වළක් කැපීම.
හුණු පිච්චීම හෝ ගබඩා කිරීම.
යන්ත්‍රානුසාරයෙන් තෙල් හිඳීම.
යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හිඳීම.
අම්ලකර වායුව යොදා ලෝකුරු වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
සිසිල් බීම සෑදීම.
කොප්පරා සෑදීම.

කොප්පරා ගබඩා කිරීම.
කපාපු පොල් වියලා සකස් කිරීම.
මීරන් වියලා සකස් කිරීම හෝ ගබඩා කිරීම.
පිදුරු ගබඩා කිරීම.
කෙඳි වර්ග නෙලීම හෝ ගබඩා කිරීම.
කපු පුළුන් (නූල් ආදිය) ගබඩා කිරීම.
ගිනිකූරු සෑදීම.
ලී හෝ දර හෝ ගබඩා කිරීම.
තේ සෑදීම සඳහා යන්ත්‍රෝපකරණ පාවිච්චි කරනු ලබන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
කම්හලක් පවත්වාගෙන යාම.
ස්වර්ණාභරණ සෑදීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
හාල් මෝලක් පවත්වාගෙන යාම.
රබර් වියලා සකස් කිරීම හෝ සෑදීම.
කොප්පරා ගබඩා කිරීම.
මෝටර් රථවාහන හෝ සාමාන්‍ය බයිසිකල් අළුත්වැඩියා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
පොල් ලෙලි පෙඟවීම පිණිස (පොල් ලෙලි) කොටුවක් පවත්වාගෙන යාම.

පහත දැක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
තොග ගණනේ විකිණීම සඳහා නරක්විය හැකි ආහාර හා ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීමට ගන්නා ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
කොම්පෝස්ට් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
සතුන්ගේ ලේ හෝ අතුණු බහන් උණුකිරීම.
සතුන්ගේ හම් ගබඩාකිරීම.
සතුන්ගේ ඇටකටු ගබඩා කිරීම.
විනාකිරි සෑදීම.
සබන් සෑදීම.
මාළු අයිස් දැමීම.
පූවක් වියලීම.
දුව දඬු පොඟවා සකස් කිරීම.
කෝඩා සෑදීම.
දුම්කොළ වියලා සකස් කිරීම.
බීඩි, සුරුට්ටු හෝ සිගරට් සෑදීම.
යන්ත්‍රානුසාරයෙන් මිරිස් කුඩු කිරීම.

පහත දැක්වෙන ව්‍යාපාර අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කෙඳි සායම් කිරීම.

ගඩොල් හෝ උළු පිච්චීම.

ගඩොල් හෝ උළු පෝරනුවක් පවත්වාගෙන යාම.

බැටරි පිරවීම.

හුණුගල් පිච්චීම, ගබඩා කිරීම, සකස් කිරීම හෝ කැබලි කිරීම.

8-486—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

# පළාත් පාලන සහා ජනද ආඥපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥා පනත
## (262 වැනි අධිකාරය)

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ, මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අපේක්ෂකයින් ඔවුන්ගේ නම්වලට කෙලින් ඇති ඒ ඒ කොට්ඨාශයේ නියෝජිතයින් වශයෙන් පෙනී සිටීම සඳහා තෝරා පත් කරන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 අගෝස්තු 4 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| කොට්ඨාශ අංකය | | | අපේක්ෂකයාගේ නම |
|---|---|---|---|
| ගාල්ල දිස්ත්‍රික්කය | | | |
| හිනිදුම ගම්සභාව | | | |
| 5 | ... | ... | ඊ. ජී. ධර්මදාස |
| යාපනය දිස්ත්‍රික්කය | | | |
| නල්ලූර් ගම්සභාව | | | |
| 2 | ... | ... | ඇස්. රාසලින්ගම් |
| අනුරාධපුරය දිස්ත්‍රික්කය | | | |
| උතුරු නුවරගම් කෝරළේ ගම්සභාව | | | |
| 8 | ... | ... | ගනිතාගේ ඕංගා |
| රත්නපුර දිස්ත්‍රික්කය | | | |
| රාස් සගල ගම්සභාව | | | |
| 9 | ... | ... | හීනගලගේ එන්දෝරිස් |

8-476—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

# අය වැය ලේඛන

## හික්කඩුව සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් නියෝග අංක 40 (ii) යටතේ කෙරෙන අයදුම් පතයි

### අය වැය ලේඛනය—1965

1965 වර්ෂයේ වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල්, අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක මුදල් පියවා ගැනීම සඳහා යෙදවීමට, 1965 ජූලි මස 31 වැනි දින පවත්වනු ලැබූ හික්කඩුව සුළු නගර සභාවේ මාසික රැස්වීමේ දී අංක 5 දරණ යෝජනා ස්ථිරත්වය අනුව පහත සඳහන් අන්දමට සම්මත කරගන්නා ලදී.

I වැනි කොටස—සාමාන්‍ය

ඉතිරි මුදල්

| | රු. | ශ. |
|---|---|---|
| සී. 8—ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 202 | 0 |
| ඩී. (6) (ඩී)—ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 800 | 0 |
| එකතුව ... | 1,002 | 0 |

අතිරේක ප්‍රතිපාදන

| | රු. | ශ. |
|---|---|---|
| ඒ (1) (බී)—ලිපිකරු වැටුප් ... ... | 33 | 0 |
| ඒ (1) (ඩී)—කා : කා : සහායක වැටුප් ... | 134 | 0 |
| ඒ (1) (ජේ)—ජීවන හා විශේෂ ජීවනාධාර ... | 100 | 0 |
| ඒ (2) (කේ)—අතිරේක දීමනා ... ... | 25 | 0 |
| ඒ (2) (ඊ)—නීතිඥ ගාස්තු ... ... | 400 | 0 |
| සී (1)—මුරකරු වැටුප් ... ... | 40 | 0 |
| ඩී (2) (ඒ)—කසල ශෝධක වැටුප් ... ... | 200 | 0 |
| ඩී (3) (ඒ)—මල ප්‍රවාහන වැටුප් ... ... | 70 | 0 |
| එකතුව ... | 1,002 | 0 |

ඒ. ටී. පියදස,
සභාපති, හික්කඩුව සුළු නගර සභාව.

1965 අගෝස්තු මස 3 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේදීය.

## හික්කඩුව සුළු නගර සභාව

### 1965 වර්ෂයේ පළමුවැනි පරිපූරක අය වැය ලේඛනය

II වැනි කොටස—විදුලිය අංශය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| 3 (ඒ)—උපකරණ ... ... ... ... ... ... | 1,000 0 |

1965 ජූලි මස 31 වැනි දින පැවැත්වූ මාසික රැස්වීමේ දී අංක 5 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

ඒ. වී. පියදස,
සභාපති, හික්කඩුව සුළු නගර සභාව.

1965 අගෝස්තු මස 3 වැනි දින,
හික්කඩුව සුළු නගර සභා කාර්යාලයේදීය.

8–475—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

# විවිධ දැන්වීම්

## කම්මල්පත්තු ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අයවළුන් විසින් එහි සඳහන් ස්ථානවල 1965 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම් පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන, කම්මල්පත්තු ගම්සභා ප්‍රදේශ සීමාවතුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එය කුමණ කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුලත මා වෙත එවිය යුතු බව දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. ඇම්. ජෝශප් ප්‍රනාන්දු, උතුරු ගෝනවිල, දංකොටුව | නැගෙනහිර නයිනමඩම, එළ හරක් මස්, ඌරු මස් සහ එළු මස් කඩය. |
| 2. ඩබ්ලිව්. පේරමානු ප්‍රනාන්දු, ගෝනවිල, දංකොටුව | බෝලවත්ත. එළ හරක් මස්, ඌරු මස් සහ එළු මස් කඩය. |

සී. බෙනඩික් ප්‍රනාන්දු,
කම්මල්පත්තු ගම්සභාවේ සභාපති තැන.

1965 ක්වූ අගෝස්තු මස 2 වෙනි දින,
වෙන්නප්පුව, දුම්මලදෙණියේ පිහිටි,
කම්මල්පත්තු ගම්සභා කාර්යාලයේ දී ය.

8–465—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය

---

## කඩුවෙල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණත

මෙහි උපලේඛනයෙහි නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1965 වර්ෂයේ අගෝස්තු මස 1 වෙනි දින පටන් 1965 දෙසැම්බර් 31 වෙනි දින දක්වා කාලයට සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ "201 වෙනි පරිච්ඡෙදයේ" 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ. එම බලපත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ගම් ප්‍රදේශයේ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන කරුණු නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 7 ක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඩී. වී. රණසිංහ ... | හරක් මස් ... | වැලිවිට මංසන්දියේ කඩේ වත්ත නම් ස්ථානයේ |

ඩී. පී. ඒ. ඩයස්,
කඩුවෙල ගම්සභාවේ සභාපති තැන.

1965 ක්වූ අගෝස්තු මස 5 වෙනි දින,
කඩුවෙල ගම්සභා කාර්යාලයේ දීය.

8–463—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

---

## රත්තොට සුළු නගර සභාව

### ගෝඝාතක ආඥාපණත

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින්, එම උපලේඛනයේ දැක්වෙන ස්ථානයෙහි 1965 වර්ෂයට මස් වෙළඳාම සඳහා පමණක් බලපත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා ඇති බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම සඳහා රත්තොට සුළු නගර සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතුව දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින්, මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි පරිච්ඡෙදයේ) අංක 7 දරන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ධර්මවතී වික්‍රම පතිරණ,
සභාපතිනිය, සුළු නගර සභාව, රත්තොට.

1965. 8. 6 වැනි දින.
රත්තොට සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඇම්. ඉසදීන් මහතා, 59, මාතලේ පාර, රත්තොට | හරක් මස් ... | රත්තොට ප්‍රසිද්ධ වෙළඳ පොළෙහි එළුමස් කඩ යට යාබදව පිහිටි කඩ කාමරය (පරණ එළුමස් කඩය) |

8–462—65.8.13 දින අංක 14,480 දරණ ගැසට් පත්‍රය.

## තිස්සමහාරාම සුළු නගර සභාව

### 1965 වරිපනම් ලේඛනය

1965 වර්ෂය සඳහා මෙම නගර සභාවේ වරිපනම් ලේඛනය දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛනය කාර්යාල වේලාවන් හිදී මෙම කාර්යාලයේ දී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වෙනි අධිකාරය වූ සුළු නගර සභා ආඥාපනතේ 165 වෙනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වෙනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපනතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. මෛත්‍රීපාල,
සභාපති,
තිස්සමහාරාම සුළු නගර සභාව.

1965 අගෝස්තු 5 දින,
තිස්සමහාරාම සුළු නගර සභා කාර්යාලයේ දී ය.

8–471—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### 1965 වර්ෂය සඳහා සුනඛ බද්ද—සුනඛයින් ලියා පදිංචිකිරීමේ ආඥාපනත (පරිච්ඡේදය 334)

සුනඛයින් ලියා පදිංචිකිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) අංක 4 වෙනි වගන්තිය යටතේ මෙම සුළු නගර සභා බල මණ්ඩලය තුළ තබාගෙන සිටින සෑම බල්ලෙකු වෙනුවෙන් ශත 50ක් ද, සෑම බැල්ලියක වෙනුවෙන් රුපියල් 1ක් ද, ලියා පදිංචිකිරීමේ ගාස්තු වශයෙන් 1965 වර්ෂය සඳහා පනවා ඇති බවද, එකී ගාස්තු 1965 ජූනි 30 වෙනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවද, රුවන්වැල්ල සුළු නගරසභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඩී. ඇම්. හේමපාල,
රුවන්වැල්ල සුළු නගරසභාවේ සභාපති.

1965 ජූනි 19 වෙනි දින,
රුවන්වැල්ල සුළු නගරසභා කාර්යාලයේ දී ය.

8–487/1—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### 1965 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද—256 වෙනි අදිකාරිය වන සුළු නගරසභා ආඥාපනත

රුවන්වැල්ල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරණු ලබන්නේ—

(1) 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපණතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උප ලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1965 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පණවා අය කිරීමටද,

(2) එකී ආඥාපණතේ 162 වගන්තිය යටතේ එකී බදු 1965 ජූනි 30 වැනිදාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ, රථ පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... ... | 5.00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළෙඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 1.50 |
| (ආ) වෙළෙඳාම හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1.00 |
| ගොන් දෙන්නා බදින සෑම බරකරත්තයක් හෝ තිරික් කලයක් සඳහා ... ... | 4.00 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික් කලයක් සඳහා ... ... ... | 2.50 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2.50 |
| සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | 2.50 |
| සෑම අශ්වයෙකුටම ... ... ... | 5.00 |
| සෑම අශ්වතරයෙකුටම හෝ සෑම බූරුවෙකුටම ... | 2.50 |

ඩී. ඇම්. හේමපාල,
සභාපති, රුවන්වැල්ල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
රුවන්වැල්ල, 1965.6.19.

8–487/2—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## බිබිල ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් සතුන් මරා මස් විකිණීම පිණිස 1965 ගේ වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන හෙයින් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව බිබිල ගම්ප්‍රදේශ සීමාව තුල පදිංචි ඕනෑම කෙනෙකුට ඒ සඳහා තමා විරුද්ධ වන්නේ අසවල් කාරණය නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවෙන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, 1947 ත් අංක 44 දරණ ආඥාපනතේ 6 වැනි ඡෙදයේ සංශෝධිත මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | වෙළඳාම කරන ස්ථානය |
|---|---|---|
| 1. ඒ. එච්. මොහොම්මදු මහතා කනුල්වෙල, බිබිල. | හරක් මස් ... | බිබිල පොදු වෙළඳ පොලේ අංක 17 කාමරය. |
| 2. ඊ. ඒ. අබ්දුල් හමීදු මහතා කනුල්වෙල, බිබිල | එළු මස් ... | බිබිල පොදු වෙළඳ පොලේ අංක 18 කාමරය |

ඇල්. එච්. ඇන්ඩර්සන් සිල්වා,
සභාපති තැන, බිබිල ගම්සභාව.

1965 අගෝස්තු 3 දින,
බිබිල ගම්සභා කායර්‍යාලයේ දීය.

8–485—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## බින්තැන්න ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උප ලේඛනයේ සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1965 අගෝස්තු මස 1 වෙනි දින සිට දෙසැම්බර් 31 වෙනි දින දක්වා කාලයට මස් පිණිස සතුන් මරා විකිණීමට බල පත්‍රයක් ඉල්ලා අයදුම් පත්‍රයක් මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන පරිච්ඡෙදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන බින්තැන්න ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එය කුමන කරුණක් සඳහා ද සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව දන්වා සිටිමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳම |
|---|---|---|
| පී. ඇස්. හම්මාත් ... | ප්‍රසිද්ධ වෙළඳ පොල, අලුත් නුවර | හරක් මස් |

කේ. බී. බලගල්ල,
බින්තැන්න ගම්සභාවේ සභාපතිතැන.

1965 ක්වූ අගෝස්තු මස 1 වෙනි දින,
බින්තැන්න ගම්සභාවේදීය.

8–470—65.8.13 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය.

සෑම සිකුරාදා දිනයක්ම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි